# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2486/12 - 2026 අප්‍රේල් මස 28 වැනි අඟහරුවාදා - 2026.04.28**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### ඌව පළාතේ පළාත් සභාව

ඌව පළාත් සභා රාජ්‍ය සේවයේ කාර්ය පටිපාටික රීති සංග්‍රහය

1987 අංක 42 දරන පළාත් සභා පනතේ 32 වගන්තිය යටතේ ඌව පළාතේ ආණ්ඩුකාරවර නීතිඥ කපිල ජයසේකර වන මා වෙත පැවරී ඇති බලතල අනුව ඌව පළාත් සභා රාජ්‍ය සේවයේ පත් කිරීම්, උසස් කිරීම් හා ස්ථාන මාරු කිරීම් හා ඊට ආනුශංගික වන කරුණු සඳහා විධිවිධාන සැලසීම සඳහා වන මෙම ඌව පළාත් සභා රාජ්‍ය සේවයේ කාර්ය පරිපාටික රීති සංග්‍රහය 2026 වර්ෂයේ මැයි මස 01 වැනි දින සිට බලාත්මක වන පරිදි පනවනු ලබන බව මෙයින් නිවේදනය කරමි.

2013.01.01 දින සිට බලාත්මක ඌව පළාත් සභා රාජ්‍ය සේවයේ කාර්ය පටිපාටික රීති සංග්‍රහය, ඒ මත ගන්නා ලද හෝ ගන්නා ලදැයි සැලකෙන සියලු තීරණ සහ ක්‍රියාමාර්ගවලට අගතියක් නොවන පරිදි 2026 වර්ෂයේ මැයි මස 01 වැනි දින සිට අවලංගු කරනු ලැබේ. එම කාර්ය පටිපාටික රීති සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව, ආරම්භකර ඇති හෝ අවසන් කර ඇති කිසිදු ක්‍රියාමාර්ගයකට මෙම අභිනව කාර්ය පටිපාටික රීති සංග්‍රහයේ විධිවිධාන කුමන හෝ ආකාරයකින් හෝ බාධාවක් නොවනු ඇත.

**නීතිඥ ජේ. එම්. කපිල ජයසේකර,**
ඌව පළාත් ආණ්ඩුකාරවර.

2026 අප්‍රේල් මස 24 වැනි දින,
ඌව පළාත් ආණ්ඩුකාරවර කාර්යාලයේ දී ය.

EOG 04 - 0216

1A - PG 7633 — 06 (2026/04)
ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*